# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: DSD/HO/SW/14/19/01-Circular | ඔබේ අංකය / உமது இல / Your No: ........................................ | දිනය / திகதி / Date: 2021.07.28 |

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

ප්‍රාදේශීය ලේකම්වරුන්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ දිස්ත්‍රික් සමෘද්ධි සහකාර අධ්‍යක්ෂවරුන්,

සමෘද්ධි කළමණාකරුවන්,

සමෘද්ධි සංවර්ධන නිළධාරීන් වෙත.

## සමෘද්ධි සහනාධාරය සඳහා සුදුසුකම් ලබන පවුල් තෝරාගැනීම.

වසම් මට්ටමින් ඉවත් වන සමෘද්ධි සහනාධාරලාභීන් වෙනුවෙන් නව සහනාධාරලාභීන් තෝරාගෙන ඔවුනට එම සහනාධාර හිමිකම ලබාදීමට අනුගමනය කලයුතු ක්‍රියාමාර්ග ඇතුලත් 2021.03.29 හා 2021.06.28 දිනැති මගේ සමාංක දරන උපදෙස් හා බැඳේ.

02. එම උපදෙස් පරිදි සියළුම දිස්ත්‍රික්ක තුළ එම කටයුත්ත ආරම්භ කර ඇති බවට මා වෙත වාර්තා වී ඇති අතර, 2021.03.29 දිනැති උපදෙස් මාලාවේ අංක 3 යටතේ සමෘද්ධි සහනාධාර නොලැබී යන අවස්ථා පිළිබඳ සඳහන් ඡේදයේ ඇති එනම්,

I. රජයේ ස්ථිර රැකියාවක් කරන සාමාජිකයෙකු පවුල් ඒකකය තුළ සිටීම.
II. රජයේ රැකියාවක නිරත වීම හේතුවෙන් විශ්‍රාම වැටුපකට හිමිකම් කියන්නෙකු පවුල් ඒකකය තුළ සිටීම.
III. ආදායම් උත්පාදන ක්‍රියාදාමයක් තුළින් ඉහළ ආදායම් හිමි පවුල්.
IV. රැකියා සඳහා විදේශ ගතවී මාස 06ක් ඉක්මව ගොස් ඇති අය සහිත පවුල්.
V. ග්‍රාමීය කමිටුව විසින් හඳුනාගනු ලබන සැලකිය යුතු දෛනික ආදායම් ලබන සාමාජිකයින් සහිත පවුල්

යන කරුණු සම්බන්ධව වැඩිදුරටත් පහත සඳහන් උපදෙස් ලබාදෙමි.

03. ඉහත කරුණු වලින් කුමන හෝ කරුණකට අදාළව හඳුනා ගනු ලබන සමෘද්ධි සහනාධාරලාභියකු ඇත්නම් ඔහුට හෝ ඇයට හිමිව තිබූ සමෘද්ධි සහනාධාරය ඉවත් කිරීමට කටයුතු කලයුතු වේ. කෙසේ නමුදු ඉහත IV හා V යන කරුණු වලට අදාළව හඳුනා ගනු ලබන සහනාධාරලාභී පවුල් ඉවත් කිරීමේදී ඉහත උපදෙස් මාලාවේ අංක 4 යටතේ දක්වා ඇති දිළිඳු බවින් යුතු සමෘද්ධි සහනාධාර හිමිවිය යුතු පවුලක් තෝරාගැනීම සඳහා සලකා බලනු ලබන නිර්නායක සම්බන්ධවද අවධානය යොමු කර සුදුසු තීරණයක් ගත හැකි වේ.

04. මෙහිදී එලෙස ඉවත් කරන පවුල් සඳහා අදාළ වසර තුලදි රු. 420/= සහනාධාර හිමිකම ලබා දී නිවාස, ලොතරැයි, අනිවාර්ය ඉතිරිකිරීම් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ සියල්ල අවශ්‍ය අවස්ථා වලදී ලබාදීමට කටයුතු කල හැකි වේ. ඉන් අනතුරුව දෙවන වසරේ සිට රජය මගින් ලබාදෙන එම සහනාධාරය ඉවත් කර රු. 420/= මුදල මාසිකව ප්‍රතිලාභියා වෙතින් අයකර ගැනීමෙන් අනතුරුව ඊට අදාළ ප්‍රතිලාභ ලබා දීමට කටයුතු කල හැකිය. එමෙන්ම ලබා දී ඇති උපදෙස් ප්‍රකාරව සමෘද්ධි පවුල හා සමාජ ආරක්ෂණ පවුල අර්ථ කථනය පදනම් කරගෙන සියළුම සමෘද්ධි සහනාධාරලාභී පවුල් සඳහා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ගෙවීමට කටයුතු සිදුකළ යුතු බවද නැවත සිහියට කැඳවමි.

05. තවද එම උපදෙස් මාලාවේ අංක 7 යටතේ දක්වා ඇති ප්‍රතිලාභීන් තෝරාගැනීම වෙනුවෙන් සහභාගී වන කමිටුවේ අවම සාමාජිකයින් ගණන දෙදෙනෙකු වන අතර, වසම්භාර සමෘද්ධි සංවර්ධන නිලධාරි සිටීම අනිවාර්ය බව නැවත දන්වා සිටිමි. එමෙන්ම දැනටමත් ලබන සහනාධාර හිමිකමක් ඉවත් කිරීමේදී ද එම ග්‍රාමීය කමිටුවේ නිර්දේශ මත කටයුතු කල යුතුය.

06. ඒ අනුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් නව සහනාධාර නිකුත් කිරීමට ප්‍රමුඛතා ලේඛණ සැකසීමක් අවශ්‍ය නොවන අතර, පොරොත්තු ලේඛණ යන වචනයද භාවිතා කලයුතු නොවේ. ඉවත්වනු ලබන සහනාධාර අදාළ වසමින් හඳුනා ගත් වෙනත් අඩු ආදායම්ලාභී පවුල් වෙත ලබාදීම සිදුකල යුතු අතර, එම වසම තුළ සහනාධාර ලැබීමට සුදුසු අඩුආදායම්ලාභීන් නොමැති අවස්ථාවලදී වෙනත් වසමකට එම හිමිකම ලබා දිය හැකි වේ. මෙහිදී දිළිඳුකම පිළිබඳව ජන හා සංඛ්‍යාලේඛණ දෙපාර්තමේන්තුව නිකුත් කර ඇති දත්තද පදනම් කර ගත හැකිය.

07. මෙමගින් සිදුකර ඇති වැඩිදුර පැහැදිලි කිරීම් වලට අමතරව ඇති අනෙකුත් උපදෙස් නොවෙනස්ව පවතින අතර, තව දුරටත් යම් පැහැදිලි කර ගැනීමක් අවශ්‍ය වන්නේ නම් සමාජ ආරක්ෂණ හා සුභසාධන අංශයේ අධ්‍යක්ෂ රණවීර මහතා 0112 – 864398 හෝ 0718 – 050999 ඔස්සේ අමතන ලෙසද කාරුණිකව දන්වමි. මෙම වැඩපිළිවෙල සාර්ථකව ඉටු කිරීම සඳහා ඔබ ලබාදෙන දායකත්වය පිළිබඳ ස්තූති වන්ත වෙමි.

**ආර්. පී. බී. තිලකසිරි**

**අධ්‍යක්ෂ ජනරාල්**

**පිටපත් :-**

1. ලේකම්, මුදල් අමාත්‍යාංශය -කා.දැ.ස.
2. ලේකම්, ආර්ථික පුනර්ජීවය හා දරිද්‍රතාවය තුරන් කිරීමේ ජනාධිපති කාර්ය සාධන බලකාය -කා.දැ.ස.
3. රාජ්‍ය ලේකම් , සමෘද්ධි, ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයංරැකියා,
   ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය. - කා.දැ.ස
4. විගණකාධිපති,විගණකාධිපති දෙපාර්තමේන්තුව. - කා.දැ.ස.
5. ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස.
6. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා. දැ.ස.
7. සියළුම අංශ ප්‍රධානීන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ. ක.ස.